සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව
+94 11 2477424 / +94 11 2477669 +94 11 2346304
communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

| | |
|---|---|
| නිකුත් කළේ | සංඛ්‍යාන දෙපාර්තමේන්තුව |
| දිනය | 2024.06.28 |

## ඉදිකිරීම් කටයුතු සඳහා වන ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය - 2024 මැයි

**ඉදිකිරීම් අංශයෙහි ශ්‍රී ලංකා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 2024 මැයි මාසයේ දර්ශකාංක 54.5ක් වාර්තා කරමින් ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල වර්ධනයක් පෙන්නුම් කරන ලදී.** අප්‍රේල් මාසයේ දීර්ඝ නිවාඩුවලින් අනතුරුව බොහෝ ඉදිකිරීම් කටයුතු මැයි මාසයේ දී යථා තත්ත්වයට පත්වන ආකාරයක් දක්නට ලැබුණි. කෙසේ වෙතත් පැවති අයහපත් කාළගුණික තත්ත්වය හේතුවෙන්, ඉදිකිරීම් කටයුතුවල අපේක්ෂිත මට්ටමේ වර්ධනයක් ලඟාකර ගැනීමට නොහැකි වූ බව සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වූ ඇතැමෙක් ප්‍රකාශ කළහ.

පෙර මාසයට සාපේක්ෂව මැයි මාසයේ දී නව ඇණවුම් සුළු වශයෙන් ඉහළ ගියේය. සමීක්ෂණයට සහභාගී වූවන්ට අනුව, දැනට ටෙන්ඩර් කිරීම සඳහා පවතින මහා පරිමාණ ව්‍යාපෘති බොහොමයක් මාර්ග ඉදිකිරීම් ව්‍යාපෘති වේ. ඔවුන්ගෙන් බොහෝ දෙනෙකු විසින් ඉදිකිරීම් කර්මාන්තය යථා තත්ත්වයට පත්කිරීම සඳහා මහා පරිමාණ යටිතල පහසුකම් ව්‍යාපෘති වැඩි වශයෙන් අවශ්‍ය වන බව අවධාරණය කරන ලදී. මේ අතර, ආයතන තවමත් සේවක බඳවා ගැනීම් පිළිබඳව සැලකිලිමත්ව කටයුතු කරන බැවින් සේවා නියුක්තිය මැයි මාසයේ දී ද අඩු වේගයකින් වුව ද පහත වැටුණි. තවද, තොග මිලදී ගැනීම් ප්‍රමාණය පෙර මාසයේ පැවති මට්ටමේම පැවතුනි. ඉදිකිරීම් ආශ්‍රිත ද්‍රව්‍යවල මිල ගණන් මැයි මාසය තුළ තවදුරටත් පහත වැටීම කර්මාන්තයට හිතකර බව බොහෝ ප්‍රතිචාර දැක්වූවන් විසින් සඳහන් කරන ලදී. මේ අතර, ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය මැයි මාසය තුළ දී ද ඉහළ අගයක පැවතුනි.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ සමීක්ෂණයේ සාරාංශය**

| විචල්‍යය | අප්‍රේ. | මැයි | +/- | දිශානතිය |
|---|---|---|---|---|
| **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)** | **31.9** | **54.5** | **+** | **පහත වැටීමක සිට ඉහළ යාමක්** |
| නව ඇණවුම් | 37.5 | 51.5 | + | පහත වැටීමක සිට ඉහළ යාමක් |
| සේවා නියුක්තිය | 38.9 | 39.4 | + | අඩු වේගයකින් පහත වැටීමක් |
| තොග මිලදී ගැනුම් | 29.2 | 50.0 | + | පහත වැටීමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | 51.4 | 51.5 | + | වැඩි වේගයකින් ඉහළ යාමක් |

මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

ඉදිරි මාස තුන සඳහා ඉදිකිරීම් කටයුතු සඳහා වන අපේක්ෂා ඉහළ මට්ටමක පවතින අතර, ඒ සඳහා ප්‍රධාන වශයෙන් නව ඉදිකිරීම් ව්‍යාපෘතිවල අපේක්ෂිත ඉහළ යාම හේතු විය.

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය (සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය)**

**54.5**

**2024 මැයි**

ඉදිකිරීම් අංශයේ සමස්ත ක්‍රියාකාරකම් දර්ශකය




මූලය: ශ්‍රී ලංකා මහ බැංකුව

**ගෝලීය ප්‍රවණතා**

**ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකවල සාරාංශයක්**

| රට/ කලාපය | දිශානතිය |
|---|---|
| යුරෝපා කලාපය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ප්‍රංශය | අඩු වේගයකින් පහත වැටීමක් |
| ජර්මනිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| අයර්ලන්තය | ඉහළ යෑමක සිට කඩඉම් මට්ටමට පැමිණීමක් |
| ඉතාලිය | අඩු වේගයකින් පහත වැටීමක් |
| එක්සත් රාජධානිය | වැඩි වේගයකින් ඉහළ යෑමක් |

*මූලාශ්‍රය: එස්&පී ග්ලෝබල් (S&P Global)[1] ආයතනය, 2024 ජූනි 27 වන දිනට*

[1] එස්&පී ග්ලෝබල් (S&P Global) ආර්ථිකයන් 40 කට අධික ප්‍රමාණයක් සඳහා ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය සම්පාදනය කරනු ලබයි.

**තාක්ෂණික සටහන:**

**ක්‍රමවේදය**

දර්ශක සම්පාදනය සහ අර්ථ නිරූපණය සඳහා එස්&පී ග්ලෝබල් (S&P Global) ආයතනයෙහි සමීක්ෂණ ක්‍රමවේදය අනුගමනය කරයි.

පිළිගත් ජාත්‍යන්තර ක්‍රමවේදයන් අනුගමනය කරමින්, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය ඉදිකිරීම් ක්‍රියාකාරකම්වල මූලික දර්ශකය ලෙස ගැනෙන අතර, එය **ඉදිකිරීම් අංශයෙහි ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය** ලෙස හඳුන්වනු ලබයි. තවද, ඉදිකිරීම් අංශයෙහි ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය, නිෂ්පාදන අංශයේ නිෂ්පාදන දර්ශකය සහ සේවා අංශයේ සේවා ව්‍යාපාර ක්‍රියාකාරකම් දර්ශකය සමඟ සැසඳිය හැකිය.

**දර්ශකය**

ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය 0 සිට 100 අතර අගයන් පරාසයක විහිදී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට සමාන නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී නොවෙනස්ව පැවතී ඇත.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා වැඩි නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී වර්ධනයක් පෙන්නුම් කරයි.
ගැනුම් කළමනාකරුවන්ගේ දර්ශකය දර්ශක ඒකක 50 ට වඩා අඩු නම් අදාළ අංශය පසුගිය මාසය හා සැසඳීමේ දී සංකෝචනයට ලක්වී ඇති බව පෙන්නුම් කරයි.

**නියැදිය**

මාසික ප්‍රතිචාර 35ක් පමණ ආවරණය වන පරිදි ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ලියාපදිංචිව ඇති ඉහළම ශ්‍රේණිගත දේශීය ඉදිකිරීම් සමාගම් ඉලක්ක කර ගනිමින් පසුගිය මාසයට සාපේක්ෂව අදාළ මාසයේ දී ඉදිකිරීම් කටයුතු වල ප්‍රවණතා ග්‍රහණය කරගැනීම සඳහා මෙම සමීක්ෂණය සිදු කරනු ලබයි.

**විචල්‍යයන්ගේ අර්ථ නිරූපණයන්**

| | |
|---|---|
| සේවා නියුක්තිය | : සමාගම සඳහා සේවය ලබාදෙන සේවකයන් ගණන |
| තොග මිලදී ගැනුම් | : නිෂ්පාදනය සඳහා යොදාගැනීමේ අරමුණින් මිල දී ගෙන ගබඩාවෙහි තබා ඇති අමුද්‍රව්‍ය |
| ඇණවුමක් සැපයීමට සැපයුම්කරුවන්ට ගතවන කාලය | : සැපයුම්කරුවෙකුට ඇණවුමක් ලබාදීමෙන් පසු එය කර්මාන්ත ශාලාවට ලැබීමට ගතවන කාලය |

අනෙකුත් විචල්‍යයන් ඒවා නම් කිරීම සඳහා යොදා ඇති වචනාර්ථයෙන්ම පැහැදිලි වේ.